# ලංසු සඳහා ආරාධනයයි

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

## ආරක්ෂක අමාත්‍යාංශය

## කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## විශ්වවිද්‍යාල රෝහල සඳහා හයිබ්‍රිඩ් අනවරත විදුලිබල සැපයුම (UPS) සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය, ක්‍රියාත්මක කොට පෙන්වීම, පුහුණුව සහ නඩත්තුව

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

**කොන්ත්‍රාත් අනන්‍යතා අංකය : MOD/KDU/02/2020**

01. ශ්‍රී ලංකාව, රත්මලාන, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උප කුලපති වෙනුවෙන්, ආරක්ෂක අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාල රෝහල සඳහා හයිබ්‍රිඩ් අනවරත විදුලිබල සැපයුම (UPS) සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය, ක්‍රියාත්මක කර පෙන්වීම, පුහුණුව හා නඩත්තුව සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

    අ) හයිබ්‍රිඩ් OT අනවරත විදුලිබල සැපයුම (UPS) සමග

02. ලංසුකරණ ක්‍රියාදාමය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය මගින් මෙහෙයවනු ඇත.

03. හයිබ්‍රිඩ් අනවරත විදුලිබල සැපයුම (UPS) සැපයීම හා නඩත්තුව පිළිබඳ අවමතරමින් වසර 10 ක පළපුරුද්දක් සහිත, අවමතරමින් වසර 10 ක කාලයක ව්‍යාපාර ලියාපදිංචියක් හිමි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. විදේශීය ලංසුකරුවන්ට යථාපරිදි පත්කළ (බලය පැවරූ) ශ්‍රී ලංකාවේ දේශීය නියෝජිතයින් මගින් මිල ගණන් ඉදිරිපත් කළ හැකිය.

- ලංසුකරුට පසුගිය වසර තුන තුළ අවමතරමින් ශ්‍රී ලංරු. මිලියන 440 ක හෝ සමාන වටිනාකමැති අගයක වාර්ෂික පිරිවැටුම් සාමාන්‍යයක් ලබා තිබිය යුතුය. (පසුගිය වසර 3 විගණිත මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය)
- ඉහත කී දේශීය නියෝජිතට අවමතරමින් වසර 05 ක ව්‍යාපාර ලියාපදිංචියක් සතු විය යුතුය.
- සියලුම සන්නාම වලට ශ්‍රී ලංකාව තුළ අවම වශයෙන් වසර 05 ක සේවා ඉතිහාසයක් තිබිය යුතුය.
- නිෂ්පාදක / සැපයුම්කරු පසුගිය වසර 5 තුළ සමාන ස්වභාවයේ කොන්ත්‍රාත් අවමතරමින් 03 ක් වත් සාර්ථකව නිමා කොට තිබිය යුතුය. මෙම කොන්ත්‍රාත් 3 න් එක් එක් කොන්ත්‍රාත්තුව ඉහත ස්වභාවයෙන් සමන්විත විය යුතු අතර, ඔවුන්ගේ කොන්ත්‍රාත් මුදල එක් සැපයුමක් සඳහා ශ්‍රී ලංරු. මිලියන 220 කට අඩු නොවිය යුතුය.
- ලංසුකරු, නිෂ්පාදක වෙතින් වසර 02 ක විස්තීර්ණ වගකීමක් සහ වසර 10 ක පද්ධති වගකීමක් සහ නිෂ්පාදකගෙන් අමතර කොටස්, පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, මෘදුකාංග සහ උපාංග ලබාගත හැකිවීම පිළිබඳ වසර 10 ක සහතික වීමත් ලබා දිය යුතුය.
- ස්ථාපනය කළ පද්ධතිය පිළිබඳ යම් ප්‍රශ්නයක් / වීමසීමක් කිරීම සඳහා දේශීය කාර්යාලයක් තිබිය යුතුය. නැතහොත් දේශීයව ලියාපදිංචි නියෝජිතයකු සිටිය යුතුය.
- භාණ්ඩ සාදන හෝ නිෂ්පාදනය කරන අයකු නොවන ලංසුකරු ලංසුකරණ ලිපිලේඛනවල IV වන කොටසේ ඇතුළත් වන ආකෘති පත්‍රය යොදා ගෙන නිෂ්පාදකගේ බලය පැවරුම ඉදිරිපත් කළ යුතුය.

04. ලංසුකරු, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ වන අවශ්‍යතාවයන් සහ පහත දැක්වෙන පරිදි පනතේ වැදගත් උපුටන කීපයක් සැලකිල්ලට භාජනය කළ යුතුය.

    (1) ඕනෑම ලංසුකරුවකු වෙනුවෙන්, ඒජන්තවරයකු හෝ උප ඒජන්තවරයකු, නියෝජිතයකු හෝ නම් කළ අයකු, තමන් සහ එම කොන්ත්‍රාත්තුව 10 වන වගන්තියට අනුකූලව ලියාපදිංචි විය යුතු අතර, 6 වන වගන්තිය යටතේ සැපයිය යුතු විස්තර රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

    (2) "ලංසුකරුවකු සඳහා හෝ වෙනුවෙන් හෝ යම් පුද්ගලයකු, ඒජන්තවරයකු, උප ඒජන්තවරයකු, නියෝජිතයකු හෝ නම් කළ අයකු වන විට ඔහු විසින්, මෙම වගන්තිය යටතේ තමන් හා පොදු කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීමට ප්‍රථම තමන් ඒජන්ත, උප – ඒජන්ත, නියෝජිත හෝ නම් කළ අය ලෙස පත් කරනු ලැබූ සහතික පළමුව ඉදිරිපත් කළ යුතුය"

    (3) ලංසුකරුවන්ට, 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි සහතිකය (අදාළ වන විට) ලංසු ඉදිරිපත් කිරීමේදී ඉදිරිපත් කරන ලෙස දැඩිව අවවාද කෙරේ.

05. කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කළ යුතු කාලය, කොන්ත්‍රාත්තුව අත්සන් කරනු ලබන දින සිට කැලැන්ඩර් දින 90 කි. (පුහුණුව හා නඩත්තුව හැර)

06. අභිලාෂී ලංසුකරුවන්ට පහත සඳහන් ලිපිනයෙන් වැඩිමනත් තොරතුරු ලබාගත හැකිය.

    **ප්‍රධාන මූල්‍ය නිලධාරී - 1,**
    **ආරක්ෂක අමාත්‍යාංශය,**
    **නො. 15/5, බාලදක්ෂ මාවත,**
    **කොළඹ 03, ශ්‍රී ලංකාව.**
    **(දුරකථනය - 011-2439381 / ෆැක්ස් 011-2390720)**

    2021 මාර්තු 08 දින සිට 2021 මාර්තු 29 දින තෙක් වැඩ කරන දිනයන්හි 0900 පැය සිට 1500 පැය දක්වා ඉහත ලිපිනයේදී ලංසුකරණ ලිපිලේඛන ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය. දුරකථනය. 011–2439381, ෆැක්ස් – 011–2390720 සහ විද්‍යුත් තැපැල procurement@defence.lk

07. ලංසුකරු හෝ ඔවුන්ගේ දේශීය නියෝජිත අසාධු ලේඛන ගත නොවූවකු විය යුතුය.

08. ශ්‍රී ලංකාව, කොළඹ – 03, බාලදක්ෂ මාවත, නො. 15/5, ආරක්ෂක අමාත්‍යාංශයේ, ප්‍රධාන මූල්‍ය නිලධාරී – 1 වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ශ්‍රී ලං රු. 36,000.00 ක (ශ්‍රී ලංකා රුපියල් තිස්හය දහසක) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2021 මාර්තු 08 දින සිට 2021 මාර්තු 29 දින දක්වා කාර්යාල දිනයන්හි 0900 පැය සිට 1500 පැය දක්වා අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

09. ලංසු 2021 මාර්තු 30 දින 1430 පැයට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාර දිය යුතුය. නැතහොත් එම ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

    **ප්‍රසම්පාදන අංශය,**
    **ආරක්ෂක අමාත්‍යාංශය,**
    **බිම් මහල,**
    **නො. 15/5, බෞද්ධාලෝක මාවත,**
    **කොළඹ - 03.**

    ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, එම අවස්ථාවට සහභාගිවීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරේ.

10. ලංසු 2021 මාර්තු 30 දින සිට 2021 ජුනි 28 දින තෙක් වලංගු විය යුතුය.

    සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකුවකින් ලබාගත් ශ්‍රී ලංකා රුපියල් මිලියන තිස්තුන් දහසක (ශ්‍රීලංරු. 3,300,000.00) කොන්දේසි රහිත ඒක්ෂණ "ලංසු සුරක්ෂණයක්" එවිය යුතුය.

11. **විමසීම් විස්තර**

    **ප්‍රධාන මූල්‍ය නිලධාරී -1,**
    **දුරකථනය : 011-2439381**
    **ෆැක්ස් අංක : 011-2390270 සහ**
    **ඊමේල් : procurement@defence.lk**
    **ප්‍රසම්පාදන නිලධාරී,**
    **ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල,**
    **වේරහැර, බොරලැස්ගමුව, ශ්‍රී ලංකාව.**
    **දුරකථනය : 0094-11-2044555 / ෆැසිමයිල් : 0094 - 11 - 2044592**
    **ඊමේල් : procurement_uh@kdurac.lk**

12. ලංසුකරුවන්ට, ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන පුද්ගලයාගේ නම / ජාතික හැඳුනුම්පත / පාස්පෝට් අංකය අවමතරමින් කාර්යාල දින තුනකට (03) පෙර පහත සඳහන් අය වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස අවවාද කෙරේ.

    **ප්‍රධාන මූල්‍ය නිලධාරී - 1,**
    **ආරක්ෂක අමාත්‍යාංශය,**
    **නො. 15/5, බෞද්ධාලෝක මාවත,**
    **කොළඹ - 03, ශ්‍රී ලංකාව.**

    අදාළ ප්‍රසම්පාදනය සඳහා ඕනෑම නිල කාර්යයකදී සහභාගි වන අයගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය / පාස්පෝට් අංකය ද පහත ලිපිනයට ලිඛිතව ඉදිරිපත් කරන ලෙස තවදුරටත් දන්වා සිටී.

    **ප්‍රධාන මූල්‍ය නිලධාරී 1,**
    **ආරක්ෂක අමාත්‍යාංශය,**
    **නො. 15/5, බෞද්ධාලෝක මාවත,**
    **කොළඹ - 03, ශ්‍රී ලංකාව.**
    **ඊමේල් : procurement@defence.lk**

13. පූර්ව – ලංසු රැස්වීමක් 2021 මාර්තු 17 දින පෙ.ව. 10.00 ට, වේරහැර, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලේ, අධ්‍යක්ෂ – වෛද්‍ය සේවා සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වෙනු ඇත.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**නො. 15/5, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ - 03, ශ්‍රී ලංකාව.**